# 5 ශ්‍රේණිය - පරිසරය ( සැප්තැම්බර් -4 සතිය )

## 13 තේමාව - පොළොව හා අහස

❖ ක්‍රියාකාරකම 1

දුවේ, පුතේ, ඔයාලගේ නිවස පිහිටා තිබෙන බිම් ප්‍රදේශය හොඳින් නිරීක්ෂණය කරන්න. ඔබේ නිවස පිහිටා ඇති ප්‍රදේශය කඳු ප්‍රදේශයක්ද/ පහත් බිම් ප්‍රදේශයක්ද/ තැනිතලා ප්‍රදේශයක් ද යන්න සොයා බලන්න. එහි ඇති ලක්ෂණ හොඳින් නිරීක්ෂණය කරන්න.

❖ ක්‍රියාකාරකම 2.

පුතාලා ශ්‍රී ලංකාවේ භූ විෂමතා දක්වෙන සිතියමක් සොයාගන්න බලන්න. එහි ඇති කඳු ප්‍රදේශ, පහත් බිම්, ගංගා, දියඇලි, හොඳින් නිරීක්ෂණය කරන්න. සිතියමේ ප්‍රධාන ගංගා පටන්ගන්නා ප්‍රදේශ හා ඒවා පහත්බිම් හරහා ගලාගොස් මුහුදට වැටෙන ස්ථාන හොඳින් බලන්න. වැඩිහිටියන්ගෙන් අසා දැනගන්න.

❖ ක්‍රියාකාරකම 3.

දුවේ, පුතේ දැන් නිවසේ හෝ වෙනත් වැඩිහිටියන්ගේ උදවු ඇතිව ලෑල්ලක් මත හෝ වෙනත් සුදුසු ස්ථානයක මැටි හෝ පල්ප් යොදා ගනිමින් ප්‍රදේශයේ භූ විෂමතා දක්වෙන ආකෘතියක් සාදන්න. එහි කුඩා වැව්, දිය පාරවල්, කුඹුරු ආදිය යොදා ගනිමින් විවිධත්වය වැඩිකරගනිමින් සාදන්න.

- ප්‍රධාන ගංගාවල නම් ලියන්න. ඒවා මුහුදට වැටෙන ස්ථාන ද සොයා ලියන්න.